**ලංකා පිඟන් සංස්ථාව - 2013**

**-----------------------------------**

ලංකා පිඟන් සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ අභිතකර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අභිතකර මතය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අභිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලංකා පිහන් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර/ ජා මූ වා ප්‍ර)

(අ) 2012 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දෙන ලද නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං ගි ප්‍ර/ ජා මූ වා ප්‍ර) පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ විශ්‍රාමගිය සේවකයින් විසින් ඔවුන්ගේ සේවා දීර්ඝ නොකිරීම් සහ ඔවුන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාවට එරෙහිව කම්කරු උසාවිවල අධිකරණ නඩු 11 ක් ගොනු කර තිබුණි. ශ්‍රී ලං ගි ප්‍ර 37- ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් හි දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල නෛතික බැඳීම් සඳහා අදාළ ප්‍රතිපාදනයක් හෝ හෙළිදරව් කිරීම් කර නොමැති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නීතිමය ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.173,700 ක මුදලක් සංස්ථාව විසින් ගෙවා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇති රු.250,094,284 ක හිමිකම් ශේෂය ශේෂපත්‍රයේ දැක්වෙන රු.138,494,826 ක හිමිකම් ශේෂය සමඟ ගැලපී නොතිබුණි. රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවෙන් (SRMC) ලැබුණු අරමුදල් සහ වරින්වර අමාත්‍යාංශ කිහිපයකින් ලද ප්‍රදාන ඇතුළත් නොකිරීම, රු.111,599,458 ක්වූ වෙනස සඳහා හේතු වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.7,088,898 ක්වූ ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් වාර්තාවේ (EPF Return) දැක්වෙන රු.236,960 ක්වූ ගෙවිය යුතු තථ්‍ය මුදලින් වෙනස් වී තිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් රු.6,851,938 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වාර්තා කිරීමේ හා වර්ගීකරණය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එරාගම හා මහියංගණය කම්හල්වල ආදායම පිළිවෙලින් රු.655,662 කින් හා රු.980,165 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) රු.1,024,825 ක්වූ 2013 සැප්තැම්බර් මාසයේ විකුණුම් ආදායම, විවිධ ආදායම් ගිණුමට සාවද්‍යව බැරකර තිබුණි. එබැවින් විකුණුම් ආදායම හා විවිධ ආදායම පිළිවෙලින් එම මුදලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපනය අනුව අතිරික්ත තොග හා හානිවූ තොග පිළිවෙලින් රු.1,818,753 ක් හා රු.911,658 ක් විය. කෙසේ වුවද අතිරික්ත තොග සඳහා හා හානි වූ තොග ප්‍රතිපාදන සඳහා 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ඊ) වැ උඩ, ඇලයාපත්තුව හා යටියන කම්හල් පිළිවෙලින් 2009, 2011 හා 2013 වර්ෂවලදී වසා දමන ලද අතර රු.12,731,807 ක් වටිනා භෞතික තොග 2013 දෙසැම්බර් 31 දිනට එම කම්හල්වල පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉහත කම්හල් තුන යටතේ දක්වන ලද මුළු තොග වටිනාකම රු.25,475,412 ක් විය. එබැවින් අවසාන තොග හා සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.12,743,605 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) 1982 හා 2001 වර්ෂවල වසාදමන ලද පිළිවෙලින් ඔඩ්ඩුසුඩාන් හා බංගදෙණිය යන කම්හල් දෙකෙහි සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික තොග ශේෂයක් නොතිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොග තුළ ඉහත කම්හල් දෙක යටතේ රු.1,750,648 ක්වූ තොග ඇතුළත් කර තිබුණි.

(ඌ) කම්හල්වල භෞතික තොග සත්‍යාපනය සමඟ සැසඳීමේදී එරාගම හා උස්වැව කම්හල් යටතේ දැක්වෙන සාමාන්‍ය තොග රු.17,056,366 කින් වැඩියෙන් හා මහියංගණය හා බිංගිරිය කම්හල් යටතේ දැක්වෙන සාමාන්‍ය තොග රු.27,226,060 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව එරාගම හා මහියංගණය කම්හල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පාරිතෝෂික ප්‍රතිපාදන රු.602,428 කින් අඩුවෙන් දක්වා තිබූ අතර උස්වැව හා යටියන කම්හල්වල පාරිතෝෂික ප්‍රතිපාදන රු.600,519 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා යොදා ගන්නා ලද එරාගම පැවති ගොඩනැගිල්ලක පින්තාරු කිරීම, විදුලි වැඩ, ලී බඩු, තිරරෙදි ආදිය සඳහා දරන ලද රු.2,659,209 ක්වූ නවීකරණය සඳහා වියදම්, නඩත්තු වියදම් ලෙස හඳුනාගනු වෙනුවට ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඔ) සංස්ථාව විසින් සිදුකරන ලද භෞතික මුදල් පරීක්ෂාව සමඟ සැසඳීමේදී එරාගම, මහියංගණය හා උස්වැව කම්හල් හා ප්‍රධාන කාර්යාලය යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුළු මුදල් ශේෂය රු.1,537,881 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) වසා දමන ලද බංගදෙණිය, ඇලයාපත්තුව, වැ උඩ, ඔඩ්ඩුසුඩාන් හා යටියන කම්හල් යටතේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.856,275 ක් වූ සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් ශේෂ විගණනය සඳහා භෞතිකව ඉදිරිපත් කර නොතිබුණි.

(ක) සංස්ථාව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබූ අතර සමහර ස්ථාවර වත්කම් සඳහා උපලේඛන පමණක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දේපල, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන ටයිල් පැලට් (Tile Pallets) ආරම්භක ශේෂය පෙර වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී රු.3,364,866 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) වාහන උපලේඛනයේ දැක්වෙන රු.2,162,747 ක් වටිනා මොටර් වාහන 31 ක් සංස්ථා පරිශ්‍රයේ භෞතිකව නොතිබූ අතර, භෞතිකව තිබූ මෝටර් වාහන 9 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ වාහන උපලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී ලංකා සෙරමික්ස් ලිමිටඩ් වසා දමා තිබූ නමුත් ශේෂ නිරවුල් කිරීමට කඩිනම් පියවර ගැනීමෙන් තොරව, 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ලෙස පිළිවෙලින් රු. 48,602,070 ක් හා රු. 22,375,918 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට උපචිතව තිබූ රු. 220,463 ක්වූ මහියංගණය කම්හලේ ජල බිල්පත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) බංගදෙණිය කම්හල වර්ෂ 10 කට පෙර වසා දමන ලද නමුත් , රු. 314,673 ක් හා රු. 1,069,613 ක්වූ පිළිවෙලින් වෙළඳ ණය ශේෂය සහ උපචිත වියදම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඈ) බංගදෙණිය හා ඇලයාපත්තුව යන වසා දමන ලද කම්හල්වලට අදාළව පිළිවෙලින් රු. 13,363,261 ක් හා රු.15,778,623 ක්වූ ගෙවිය යුතු බදු 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඔඩ්ඩුසුඩාන් කම්හලෙන් අයකර ගත යුතු රු. 262,167 ක්වූ උත්සව අත්තිකාරම් වර්ෂ 26 කට වැඩි කාලයක් ගිණුම්වල පැවතුණි.

(ඊ) වසා දමන ලද කම්හල් 5 කට අදාළව රු. 33,939,592 ක් වූ සංචිත, විධිමත් ගැලපීම් කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

(උ) නිරවුල් කිරීම හෝ ගැලපීම් කිරීමෙන් තොරව වසා දමන ලද කම්හල් 5 ක් යටතේ ණයගැතියන් තුළ රු. 757,674 ක මුදලක් ඇතුළත් කර තිබුණි.

(ඌ) 2008 වර්ෂයේ සිට ඇලයාපත්තුව කම්හල සඳහා පුද්ගලික ආයතනයකින් ලැබිය යුතු රු.854,658 ක මුදලක් 2014 සැප්තැම්බර් අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වවුචර්, උපලේඛන ආදී ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හේතුවෙන් රු. 5,778,494 ක් හෙවත් මුළු පරිපාලන වියදමෙන් සියයට 82 ක්වූ මධ්‍යම පරිපාලන වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) සංස්ථාවේ නිසි බලධාරිගේ ප්‍රකාශනයට අනුව, වැ උඩ හා ඇලයාපත්තුව කම්හල් 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා යුධ හමුදාවට භාර දී තිබුණි. කෙසේ වුවද ඒ පිළිබඳ සාක්ෂි කිසිවක් විගණනයට ලැබී නොතිබුණි.

(ඇ) හිඟ බදු නිරවුල් කිරීම සඳහා වාරික පදනම මත රු.30,000 ක ගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව හා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව අතර එළඹි ගිවිසුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.3 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

**-------------------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ පනත | 5,056,579 | දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එන ලද එකතුව රු.171,759,557 ක්වූ බදු 2013 දෙසැම්බර් 31 වන විටත් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි. |
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 55,574,968 | |
| 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | 11,002,254 | |
| 1995 අංක 36 දරන ජාතික ආරක්ෂක බදු පනත | 38,406,286 | |
| 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත | 59,488,624 | |
| 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත | 2,230,846 | |
| (ආ) 1990 අංක 6 දරන බස්නාහිර පළාත් මුදල් ප්‍රඥප්තිය | 5,583,755 | බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස්වරයාට ප්‍රේෂණය කළ යුතු පිරිවැටුම් බදු 2013 දෙසැම්බර් 31 වනවිටත් ප්‍රේෂණය කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 5,287,855 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 5,149,861 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු. 137,994 ක වර්ධනයක් දැක්වුණි. වර්ධනය සඳහා හේතු පහත සාරාංශ කර දැක්වේ.

| ගිණුම් විෂයය | 2013 | 2012 | (හිතකර වෙනස / අහිතකර) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආදායම | 77,920,760 | 112,655,859 | (34,735,099) |
| විකුණුම් පිරිවැය | (68,764,795) | (105,380,353) | 36,615,558 |
| දළ ලාභය | 9,155,965 | 7,275,506 | 1,880,459 |
| වෙනත් ආදායම | 3,415,969 | 12,107,644 | (8,691,675) |
| මෙහෙයුම් වියදම් | (7,284,079) | (14,233,289) | 6,949,210 |
| බදු පූර්ව ශුද්ධ ලාභය | 5,287,855 | 5,149,861 | 137,994 |

### 3.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2013 | 2012 | නිරීක්ෂණය |
|---|---|---|---|
| තොග පිරිවැටුම් අනුපාතය | 1:0.96 | 1:1.70 | තොග, විකුණුම් සඳහා පරිවර්තනය කිරීමට දිගු කාලයක් ගෙන තිබූ බව එයින් දැක්වේ. |
| තොග පිරිවැටුම (දින ගණනින්) | දින 380 | දින 214 | |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් කම්හල් නවයෙන් එරාගම, මහියංගණය, බිංගිරිය, යටියන හා උස්වැව යන කම්හල් 5 පමණක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මකව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 3 ක එම කම්හල්වල ලාභදායීත්වය පහත දැක්වේ.

| කම්හල | වර්ෂය සඳහා ලාභය/ (පාඩුව) | | | |
|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2010 |
| | රු. | රු. | රු. | රු. |
| බිංගිරිය | 934,690 | (1,711,014) | (6,837,118) | (7,468,051) |
| මහියංගණය | 1,512,804 | 3,978,017 | (20,981,620) | (15,457,782) |
| යටියන | (3,155,256) | (4,751,744) | (14,382,036) | (12,071,994) |
| උස්වැව | (5,303,273) | (8,985,412) | (17,127,924) | (13,800,090) |
| එරාගම | 11,651,721 | 22,720,384 | (4,148,425) | 3,825,335 |

(i) සමාලෝචිත වර්ෂය තුළ යටියන හා උස්වැව කම්හල් රු. 8,458,529 ක විශාල පාඩුවක් දරා තිබූ අතර, අමුද්‍රව්‍ය හිඟකම හේතුවෙන් යටියන කම්හල සමාලෝචිත වර්ෂය තුළදී වසා දමා තිබුණි.

(ii) පෙර වර්ෂයට සාපේක්ෂව එරාගම හා මහියංගණය කම්හල්වල ලාභ පිළිවෙලින් රු.11,068,663 කින් හා රු. 2,465,213 කින් විශාල ලෙස අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මකව පැවති කම්හල් පහක පිහන් ගඩොල්, ගඩොල් හා වෙනත් ද්‍රව්‍ය පිළිබඳ ඇස්තමේන්තුගත නිෂ්පාදනය ඒකක 6,519,688 ක් වුවද, තථ්‍ය නිෂ්පාදනය ඒකක 3,970,921 ක් හෙවත් ඇස්තමේන්තුගත ප්‍රමාණයෙන් සියයට 61 ක් විය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

නියමිත දිනට සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සංස්ථාවට රු. 1,700,000 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.3 මානව සම්පත් කළමානකරණය

-----------------------------------

යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, සංස්ථාව විසින් එහි ප්‍රතිසංස්කරණයෙන් පසුව සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණි. සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට එහි තථ්‍ය සේවක සංඛ්‍යාව ස්ථිර සේවකයින් 43 ක් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් 179 ක ගෙන් සමන්විත විය.

## 4.4 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

-----------------------------

පහත සඳහන් හේතුන් මත සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඇති හැකියාව සැක සහිතය.

(අ) 2012 හා 2013 වර්ෂය අවසානයට පිළිවෙලින් රු. 247,380,646 ක් හා රු. 138,494,826 ක්වූ ඍණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවල නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සංස්ථාවේ වගකීම්වලට මුළු වත්කම් අනුපාතය පිළිවෙලින් 1:1.9 ක් හා 1:2.6 ක් විය.

(ඇ) සේවකයින් 540 ක මුළු සංඛ්‍යාවෙන්, සේවකයින් 497 ක් 2012 වර්ෂයේදී වන්දි ගෙවීම මත ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී සේවකයින් 43 ක් ස්ථිර කාර්ය මණ්ඩලය ලෙස රැඳී තිබුණි.

(ඈ) සංස්ථාව සතු කම්හල් 09 කින් දැනට කම්හල් 04 ක් පමණක් ක්‍රියාත්මකව පැවති අතර, යුධ වාතාවරණය හා අමුද්‍රව්‍ය හිඟකම හේතුවෙන් ඉතිරි කම්හල් 5 වසා දමා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 විගණන කමිටුව

-----------------

2006 අගෝස්තු 28 දිනැති අංක පීඑෆ්/පීඑස්/04 (XII) දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 ඡේදය අනුව, සංස්ථාව තුළ විගණන කමිටුවක් ක්‍රියාත්මකව නොතිබුණි. එවැනි කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර, කමිටුව ක්‍රමවත් පරිදි රැස්වෙන බවට තහවුරු කරගෙන පෙර කමිටු රැස්වීම්වල නිර්දේශයන් පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකළ යුතුය. එසේ වුවද සංස්ථාවේ කළමනාකරණය විසින් කමිටුව පත්කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අවධානය යොමු කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.4 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එබැවින් අයවැය ලේඛනය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීම කෙරෙහි සංස්ථාව විසින් අවධානය යොමුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු නිසි බලධාරිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් උපයෝජනය
(ඇ) ණයගැතියන් හා ණයහිමියන් පිළිබඳ පාලනය
(ඈ) සේවක කළමනාකරණය